# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2470/30 – 2026 ජනවාරි මස 07 වැනි බදාදා – 2026.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

### සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපාකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන් :

1) පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් දෙමටලුව, ඇබලව, පේරගොල්ල වත්ත, නො. 43 දරන ස්ථානයේ පිහිටි “සූර්යෝදා සංවිධාන එකමුතුව” නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3 (ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

   i. ශ්‍රී ලංකාවේ ජන සමාජය ශක්තිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය අයුරින් සහය වීම.

   ii. ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ සමාජ ව්‍යවසායකත්වය සවිබල ගැන්වීමට සහ නගා සිටුවීමට රාජ්‍ය හා පෞද්ගලික අංශ වලට සහය දැක්වීම.

   iii. සෑම ගමකම ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රජාව විසින් සංවිධානය කර පවත්වාගෙන යන ස්වේච්ඡා සංවිධාන එකමුතු කරමින් එකී සංවිධාන වල අරමුණු සාධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට මැදිහත් වීම.

   iv. ප්‍රජාතාන්ත්‍රවාදය, ප්‍රජාව, ආර්ථික අයිතීන් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

   v. සංවිධානය නොවූ ජනතාව සංවිධානගත කිරීම.


1A – G 046033 – 04 (2026/01)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5 (4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා
සමූපාකාර සංවර්ධන අමාත්‍ය

2025 දෙසැම්බර් මස 29 වැනි දින,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපාකාර සංවර්ධන අමාත්‍යාංශය,
නො. 492, දෙවන මහල,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර් ඒ ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 01-0057/1

---

සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපාකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන් ;

i. NVQ 5 හෝ NVQ 6 යන වෘත්තීය සුදුසුකම් මත රජයේ සහ පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත ඉංජිනේරු/ඉංජිනේරු සහකාර/කාර්මික නිලධාරීන්/වැඩ අධිකාරී/ යන සේවා කාණ්ඩවල සියලුම සාමාජිකයන්ගේ අයිතිවාසිකම් රැක ගැනීම, වර්ධනය කර ගැනීම උදෙසා වගකිව යුතු නීතිමය පිළිගැනීමක් සහිත සංවිධානයක් ගොඩ නැගීම.

ii. විවිධ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ආයතනවල විවිධ සේවායෝජක කාණ්ඩ යටතේ සේවය කරන, NVQ 6 හෝ NVQ 5 සුදුසුකම් ලත් සියලුම සාමාජිකයින් සඳහා සුදුසු සහ අදාළ රැකියා කාණ්ඩයක් ලබා ගැනීමට උත්සාහ කිරීම.

iii. රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් වගකිවයුතු ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් වෘත්තියේ ප්‍රමිතිය ඉහළ නැංවීමේ ක්‍රියාවලියේදී පහසුකම් සැලසීමට/ සම්බන්ධීකරණය කිරීමට සහාය වීම.

iv. වෘත්තීය අනාගත සුරක්ෂිත තාවය, නිපුණත්වය, දියුණු කිරීමට අවශ්‍ය වන යෝජනා කාර්මික විද්‍යාල සහ අනෙකුත් පුහුණු ආයතන වෙත ලබාදීම.

v. සාමාජිකයන්ගේ සේවා ගැටලු වලදී අවශ්‍ය සහාය ලබාදීම එකඟ වන රීති මාලාවක් යටතේ නීති ආධාර ලබා දීම.

යන පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වස්කඩුව, මනන්දුව, නො. 85 දරන ස්ථානයේ පිහිටි සොසයිටි ඔෆ් ඉන්ජිනියරින් සර්විසස් ඔෆිසර්ස් ලිමිටඩ් නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3 (ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා
සමූපාකාර සංවර්ධන අමාත්‍ය

2025 දෙසැම්බර් මස 29 වැනි දින,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපාකාර සංවර්ධන අමාත්‍යාංශය,
නො. 492, දෙවන මහල,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර් ඒ ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 01-0057/2

## සමිති ආඥාපනත

සමිති ආඥාපනතේ (123 අධිකාරය) 3 වන හා 4 වන වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපාකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ වන මම මේ නිවේදනයෙන් :

1) පහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකාව, දාරළුව, දාරළුව දරන ස්ථානයේ පිහිටි "මෙට්ෂු නැචුරල් ෆාමර්ස් ඇසෝසියේෂන්" නමැති සමිතිය 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 3 (ආ) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා බලය පවරමි.

   i. ශ්‍රී ලංකාවේ පිහිටා ඇති පොල් ඉඩම් වලින් ලැබෙන පොල් අස්වැන්න වැඩි කිරීම මඟින් ගොවීන්ගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීම.

   ii. ශ්‍රී ලංකාවේ පොල් හිඟය අවම කිරීම

   iii. සාමාජිකයන්ගේ පොල් අස්වැන්න සඳහා සාධාරණ මිළක් ලබා දීම.

2) ඉහත කී සමිතිය, සමිති ආඥාපනතේ 5 (4) වගන්තියේ විධිවිධාන වලින් නිදහස් කරමි.

**වසන්ත සමරසිංහ,**
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා
සමූපාකාර සංවර්ධන අමාත්‍ය

2025 දෙසැම්බර් මස 29 වැනි දින,
වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපාකාර සංවර්ධන අමාත්‍යාංශය,
නො. 492,
එල් එච් පී ගොඩනැගිල්ල,
ආර් ඒ ද මෙල් මාවත,
කොළඹ 03.

EOG 01-0057/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.